# ඉස්ලාම්

## ගුරු මාර්ගෝපදේශය

### තුන්වන ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

# ඉස්ලාම්

## ගුරු මාර්ගෝපදේශය

## තුන්වන ශ්‍රේණිය

**(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

**ඉස්ලාම්**

**තුන්වන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

ප්‍රථම මුද්‍රණය 2018

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN .................

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info @ nie.lk

*මුද්‍රණය* :

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ  සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත.  පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත.  සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ.  එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද,  රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මත බැහැර කිරීමට ද, සුභාවිත තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද, මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද, අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ සහ සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුම ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක් වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි තේමා සහ නිපුණතා සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයා හට ද, දෙගුරුනට ද, භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරු භවතුන් පෙළ පොත හා මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයවල සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂයය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනඟා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැ යි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය, පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය :**

**උපදේශකත්වය :** ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන ස්වාමීන් වහන්සේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

අෂ් ෂෙයික් එම්.එස්.එම්. බාරි මයා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අරාබි හා ඉස්ලාම් අධ්‍යයන දෙපාර්තමේන්තුව,

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

මෞලවි එම්. අයි. එම්. නව්ෆර්දීන් මයා
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය

එම්. ආර්. ඩබ්ලියු. මද්දුම මහතා
අධ්‍යක්ෂ (මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන)
ජාතික අධ්‍යාපන ආයතනය

මව්ලවි එම්.ටී. ඉක්බාල්, ගුරු උපදේශක, කොළඹ අධ්‍යාපන කලාප කාර්යාලය)

**අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : අෂ් ෂෙයික් ජේ.එම්. ජසාර්
සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය :**

**අභ්‍යන්තර සම්පත් දායකත්වය -**

අෂ් ෂේයික් ජේ.එම්. ජසාර්
සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**බාහිර සම්පත් දායකත්වය**

එස්.එම්.ආර්. සුදීන්, විශ්‍රාමික ප්‍රධාන ව්‍යාපෘති නිළධාරි, ජාතික අධ්‍යාපන ආයතනය

එම්.එච්.එම්. නාලිර්, විශ්‍රාමික (ගුරු සේවය)

අෂ් ෂෙයික් එම්.එච්.එම්. බුහාරි, ගුරු උපදේශක (ඉස්ලාම්), මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

අෂ් ෂෙයික් එම්.එම්.ඒ. බිස්තාමි, (ගුරු සේවය) කළ/අල් මුබාරක් විදුහල, මල්වාන)

යෙස්මින් හිzසාර් මිය (ගුරු සේවය) කො/සහිරා විදුහල

**විෂය සංස්කරණය :** අෂ් ෂෙයික් ජේ.එම්. ජසාර්
සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

# හැඳින්වීම

ජාතික අරමුණු ඉටු කර ගැනීම සඳහා පාදක වන මූලික නිපුණතා ඇසුරින් 'ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා' දරුවන් තුළ ගොඩනැංවීම 'ආගම' විෂයයේ වගකීම වෙයි.

කුඩා දරුවකුගේ ළපටි මනසෙහි අලුත් යමක් රෝපණය කිරීම පහසු ය. එ සේ ම යහපත් චර්යාවලට සහ වත් පිළිවෙත්වලට කුඩා දරුවකු අනුගත කිරීම ද වඩා ඉක්මනින් කළ හැකි ය. කුඩා දරුවකු තුළ පවත්නා එම ගුණාංගවලට මනා ව ගැළපෙන සේ මෙහි විවිධ ක්‍රියාකාරකම් යෝජනා කර ඇත. විෂය අන්තර්ගතයට අනුකූල ව සිසු දරුවාට අදාළ නිපුණතාව ලබා දෙමින් ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීමට එම ක්‍රියාකාරකම් ඔබට මාර්ගෝපදේශයක් වනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

සමාජයක සාමය සහ සදාචාරය පවත්වා ගැනීමට සියලු ම ආගම්වලින් ලැබෙන දායකත්වය සුළුපටු නො වේ. තව ද, තමා හැම අයුරින් ම පෝෂණය කර ගුණාත්මක ජීවිතයක් ගත කිරීමට ශ්‍රම දායකත්වය සපයන මිනිස් සමාජයට කෘතවේදී වෙමින් පෙරළා අවංක සේවයක් කිරීමටත්, යහගුණවලින් හෙබි මනුෂ්‍යයකු ලෙස අභිමානයෙන් යුතු ව ජීවත් වීමටත්, ආගමකින් ලැබෙන පන්නරය අතිමහත් ය. එ පමණක් නො ව අප එකිනෙකා විශ්වාස කරන පරිදි මරණින් ඔබ්බෙහි දී ද යහපතක් උදා කර ගැනීම සඳහා ආගමික ඉගැන්වීම් අපට නිසැක ව ම පිහිට වෙයි.

දැහැමි සමාජයක් බිහි කිරීමේ උදාර කර්තව්‍යය ආරම්භ කළ යුත්තේ ප්‍රාථමික අවධියේ කුඩා දරුවා ගෙනි. ඒ මහඟු කර්තව්‍යය භාර ගෙන සිටින භාග්‍යවන්ත වූ ගුරුභවතා ඔබ යි. ඒ සඳහා ඔබෙන් ලැබෙන දායකත්වය සහ කැපවීම මහත් සේ අගයමු.

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මඟින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුම්වත් වීම සහ හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

i. **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රවල දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

ii. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

iii. **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

iv. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. **ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය


vi. **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

vii. **ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින්ට ශක්තිය ලබා දීම

# ප්‍රාථමික විෂයමාලා සැලැස්ම



# කාලය බෙදා ගැනීම

## දෙවන ප්‍රධාන අවධිය (තුන්වන සහ හතරවන ශ්‍රේණි)

| විෂයය | | සතියකට වෙන් කර ඇති කාලය |
|---|---|---|
| 1. | මවු බස | පැය 5.00 |
| 2. | ගණිතය | පැය 5.00 |
| 3. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 6.00 |
| 4. | ඉංග්‍රීසි | පැය 3.00 |
| 5. | දෙවන ජාතික භාෂාව | පැය 1.00 |
| 6. | ආගම | පැය 2.00 |
| 7. | උදය රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1.15 |
| 8. | විවේක කාලය | පැය 1.40 |
| 9. | ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 2.05 |
| 10. | විෂය සමගාමී ක්‍රියාකාරකම | මිනිත්තු 30 (සතියේ එක් දිනෙක) |
| | **සතියක මුළු කාලය** | පැය **27.30** |

# ඉස්ලාම් ගුරු මාර්ගෝපදේශය පරිශීලනයට උපදෙස්

ඉස්ලාම් යනු ජීවන මාර්ගයකි. මෙම විෂයය සකස් වන්නේ එම ජීවන මාර්ගය හැදෑරීමේ ක්‍රමයක් වශයෙනි. බාල පරපුර විවිධ ආයතන මගින් ඉස්ලාම් විෂයය හදාරන මුත් ගුරුවරයකුගේ මග පෙන්වීම සහිත ව සිදු වන අන්‍යොන්‍ය සන්නිවේදනය සහිත පාසල් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් ඉස්ලාම් ධර්මය සිසුන්ගේ සිත්සතන්වල සනිටුහන් කිරීමත්, ඔවුන්ගේ ප්‍රායෝගික ජීවිතයට කාවැද්දීමත්, වඩා පහසු ය.

ආගමික අධ්‍යාපනයේ අවශ්‍යතාව වත්මන් සමාජ වාතාවරණය තුළ කැපී පෙනෙයි. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්තාවේ අන්තර්ගත ආචාර ධර්ම හා ආගමට අදාළ නිපුණතා පමණක් නොව සෙසු නිපුණතා වර්ධනය සඳහා ද ඉස්ලාම් ධර්මයට විශාල මෙහෙයක් කළ හැකි ය. ඒ ඔස්සේ ජාතික පොදු අරමුණු කරා ළඟා වීමට ඉවහල් වන පරිදි ප්‍රාථමික අවධියේ ඉස්ලාම් ධර්මය විෂය නිර්දේශය සැකසී ඇත.

## ප්‍රාථමික අවධිය සඳහා වන නිපුණතා

- අල්ලාහ් සිටින බව පිළිගෙන සෑම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි.
- අර්කානුල් ඊමාන් පිළිගෙන ක්‍රියාත්මක කරයි.
- අර්කානුල් ඉස්ලාම් පිළිගෙන ක්‍රියාත්මක කරයි.
- එදිනෙදා ජීවිතයේ දී මුස්ලිම්වරු පිළිපැදිය යුතු සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කරයි.
- දෛනික ජීවිතයේ දී මුස්ලිම් ආචාර ධර්ම අඛණ්ඩ ව පිළිපදියි.
- සාමූහික ජීවිතයට අදාළ ගුණධර්ම හා සාරධර්ම (අහ්ලාක් හා ආදාත්) පිළිපදියි.
- නබි (සල්) තුමාණන් කෙරෙහි සෙනෙහසින් යුතු ව එතුමාණන්ගේ ආදර්ශ පිළිපදිමින් ජීවත් වෙයි.
- අල් කුර්ආනය හැදින, පාරායනය කර, එහි උපදෙස් පිළිපදියි.
- මස්ජිදය මුස්ලිම්වරුන්ගේ පූජනීය ස්ථානය බව ප්‍රකාශ කරයි.
- ඉස්ලාමීය ඉතිහාසයේ බිහි වූ විද්වතුන්ගේ ප්‍රතිපත්ති අගය කරමින් ඒවා ආදර්ශයට ගනියි.

**1 5 ශ්‍රේණි දක්වා ප්‍රාථමික අවධියේ ඉස්ලාම් ධර්මය පිළිබඳ ඉගෙනුම් අත්දැකීම් ලබන සිසුන්, ප්‍රාථමික අවධිය අවසාන කරන විට උක්ත නිපුණතාවලට ළඟා වීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා අදාළ විෂය අන්තර්ගතය, විෂය නිර්දේශවල දක්වනු ලබන අතර ඊට අදාළ ව ක්‍රියාකාරකම් පාදක ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා යෝජනා කර ඇති ඉගෙනුම්ඉගැන්වීම් ක්‍රමෝපාය වඩාත් නිර්මාණශීලී ව භාවිත කරනු ඇතැ යි අපේක්ෂා කෙරේ. ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීමේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරකයක් ලෙස පමණක් පෙළ පොත යොදා ගැනීම සුදුසු ය.**

### ඉගැන්වීමේ ක්‍රමෝපාය

ප්‍රාථමික ශ්‍රේණිවල ඉස්ලාම් ඉගැන්වීමේ දී කුඩා දරුවන් ප්‍රිය කරන ආගමික ජීවිතය හා සමීප ක්‍රියාකාරකම් බහුල ලෙස යොදා ගත යුතු වේ. ආගමික චාරිකා, මස්ජිදය නැරඹීම, වත්පිළිවෙත් මේ අතර ප්‍රධාන තැනක් ගනියි.

තව ද ඉස්ලාමීය ඉතිහාසයේ බිහි වූ විද්වතුන් ගේ තොරතුරු, නබි (සල්) තුමාණන් සම්බන්ධ ආදර්ශවත් කතා දෘශ්‍යාධාර සමග රසවත් ව ඉදිරිපත් කළ යුතු ය. මේ හා සම්බන්ධ ගායනා, රංගන, චිත්‍ර ඇඳීම වැනි සෞන්දර්ය මුසු ක්‍රියාකාරකම්වල දරුවන් නිරත කරවීමට ද නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතු වෙයි. එය ශිෂ්‍යයාට වින්දනයක් ගෙන දෙන ලෙස ඉතාමත් සුන්දර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් බැවින් එම ක්‍රමවේද සියල්ල මගින් ඉස්ලාම් ඉගෙනීමට දැඩි ආශාවක් දරුවන් තුළ ඇති වනු ඇත. එ මෙන් ම දරුවා තුළ ක්‍රමයෙන් අල්ලාහ් පිළිබඳ විශ්වාසය තහවුරු කිරීමක් ද සිදු වේ.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

පාසල් සංස්කෘතිය හා සම්බන්ධ වැඩසටහන්වලින් ඉස්ලාම් විෂයය සම්බන්ධ බොහෝ නිපුණතා ආවරණය කළ හැකි ය. එසේ ම තහවුරු කළ හැකි ය. තව ද පාසල් සංස්කෘතිය තුළ මෙම නිපුණතා ගොඩ නැගෙන නව අංග ඇති කිරීම කෙරෙහි ද විදුහල්පතිවරුන්ගේ සුවිශේෂ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රාථමික පාසල සඳහා ක්‍රියාත්මක වන උදය ආගමික වැඩසටහන් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. පළමු වන ශ්‍රේණියේ දී ඉතා සරල ව අරඹා පස් වන ශ්‍රේණිය දක්වා මෙම වැඩසටහන ක්‍රමයෙන් දියුණු කරමින් විවිධ අංග එක් කළ හැකි ය.

පවිත්‍රතාව, විනීත බව, සහයෝගය, ගුරුවරුන් කෙරෙහි පැවැත්විය යුතු ආචාර ධර්ම, ආශිර්වාද ඇසුරෙන් ගොඩ නැගෙන සමානාත්මතාව, සුහදත්වය, සහෝදරත්වය ආදි ලක්ෂණවලින් පාසල් පරිසරය හා සම්බන්ධ සංස්කෘතිය අලංකාර කෙරේ. ඉහත සංස්කෘතිය තුළ කතෝලික ධර්මය විෂයයෙන් අපේක්ෂිත නිපුණතා වර්ධනය වන අවස්ථා උදා කළ හැකි ය. මෙ මගින් විෂය අන්තර්ගතය තුළ ඇති සියල්ල ප්‍රායෝගික භාවිතයට ද අවස්ථා උදා වේ.

## තක්සේරු කිරීම

ප්‍රාථමික ශ්‍රේණිවල දී ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරු කර ගත් ඇගයීම්වලට ය. නිරීක්ෂණය, ගවේෂණය, ක්ෂේත්‍ර චාරිකා, අභිනය, නාට්‍ය, රූකඩ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ඇගයීම් මේ සඳහා උචිත වෙයි.

# පටුන


| | පිටුව |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| හැඳින්වීම | vi |
| ජාතික අරමුණු | vii |
| මූලික නිපුණතා | viii - ix |
| විෂයමාලා සැලැස්ම | x |
| කාලය බෙදා ගැනීම | xi |
| බුද්ධ ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | xii - xiii |
| පටුන | xiv |
| විෂය නිර්දේශය හා ඉගෙනුම් සැලැස්ම | xv |
| ඉගෙනුම් - ඉගැන්වීම ක්‍රියාවලිය | 1 |

# විෂය නිර්දේශය

# හා

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා

# උපදෙස්

# විෂය අරමුණු

1. දරුවන් තුළ අල්ලාහ් පිළිබඳ විශ්වාසය තහවුරු කිරීම

2. අල්ලාහ් විසින් මුහම්මද් නබි (සල්) තුමාට පහළ කරන ලද අල් කුර්ආනයට නිසි ගෞරව දැක්වීමටත්, ඒ අනුව ජීවිතය හැඩගස්වා ගැනීමටත්, යොමු කිරීම

3. ඊමාන්(විශ්වාස) කළ යුතු කරුණු හය පිළිපදිමින් ඉස්ලාමීය ප්‍රතිපත්ති ඇති කර ගැනීමට මග පෙන්වීම

4. නබිවරු ඇතුළු සලෆුස්සාලිහීන්වරුන්ගේ චරිතාපදාන ඇසුරින් ලබා ගන්නා ආදර්ශවලට අනුකූල වූ ජීවන දර්ශනයක් ගොඩනැංවීම

5. ඉස්ලාමීය සිරිත්විරිත් පිළිපදින්නා වූත්, මුස්ලිම් අනන්‍යතාව ප්‍රදර්ශනය කරන්නා වූත්, චර්යා ඇති කිරීම

6. දික්ර්, අව්රාද්, සහ සූරා නිවැරැදි ව උච්චාරණය කරමින් පාරායනය කිරීමටත්, විශ්වාසයෙන් යුතු ව ආගමික වතාවත්වල නිරත වීමටත්, පුරුදු පුහුණු කරවීම

7. මස්ජිදය දේව නිවස වශයෙන් සලකා ගෞරව කිරීමට පෙලඹවීම

8. ඉස්ලාමයේ ඉගැන්වෙන පරිදි සියල්ලන්ට ම ආදරය දැක්වීම, උදව් කිරීම, අසල්වැසියන් සමග එකමුතු ව ජීවත් වීම සම්බන්ධ අත්දැකීම් ලබා දීම

9. උපවාසයෙහි යෙදීමේ ප්‍රතිපත්තිමය වටිනාකමත්, හජ් වන්දනාව ඉටු කිරීමේ වැදගත්කමත් පිළිබඳ අවබෝධයක් ලබා දීම

10. අන්‍යාගමික සිරිත්වලට ගරු කරමින් සහයෝගයෙන් ජීවත් වීමේ ආකල්ප රෝපණය කිරීම

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
| --- | --- | --- |
| 1.0 අල්ලාහ් සිටින බව පිළිගෙන සැමවිට ම අල්ලාහ් සිහිපත් කිරීම. | 1.0 අල්ලාහ් සිටින බව පිළිගෙන සැම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි. | 1.1<br>• අල්ලාහු රාසිකුනා<br>• අල්ලාහ් මවා පාලනය කරන්නය<br>• අල්ලාහ් මැවීම් පාලනය කරන ආකාරය |
| 2.0 අර්කානුල් ඊමාන් පිළිබඳ දැන පැවසීම | 2.0 අර්කානුල් ඊමාන් පිළිගෙන, අන්අයට කියා දෙයි.<br><br>2.1 මලායිකාවරු විශ්වාස කර ඒ අනුව කටයුතු කරයි | 2.1 මලායිකාවරු දහ දෙනා<br>• මලායිකාවරු අල්ලාහ්ගේ මැවුම්ය<br>• මලායිකාරුන්ගේ විවිධ කාර්යභාරයන්<br>• ප්‍රධාන මැලක්වරු දහදෙනා |
| 3.0 අර්කානුල් ඉස්ලාම් පිළිබඳ දැන පැවසීම | 3.0 අල් කුර්ආනය විශ්වාස කර එය පාරායනා කරන අතර එහි ඉගෙන්වීම් අනුගමනය කරයි | 3.1 අල් කුර්ආන්<br>• අල්කුර්ආනය අපගේ ආගමික ග්‍රන්ථය වේ.<br>• එය නබි (සල්) තුමාට පහළ කරන ලදි<br>• එය පාරායනා කළ යුත්තකි. සවන්දිය යුත්තකි.<br>• පිරිසිදුව සිටිමින් ගරුබුහුමන් සහිතව අඋඥු, බිස්මි උසුරා පාරායනය කිරීම. |
| 4.0 අර්කානුල් ඉස්ලාමය විශ්වාස කර කටයුතු කිරීම | 4.0 සලාතය හා වුලූඃ දැන ක්‍රියාත්මක කරයි<br>4.1 සලාතයේ අව්රාදයන් (පාරායනාවන්) කටපාඩම් කරයි | 4.1 • වුලූඃ කරන ආකාරය<br>• සලාතය හා එහි වක්තයන් |
| 5.0 අත්තහාරා පිළිබඳව අවබෝධය ලබාගනියි | 5.0 දෛනික ජීවිතයේ දී මුස්ලිම්වරු පිළිපැදිය යුතු යහපත් සෞඛ්‍ය පුරුදු අඛණ්ඩ ව පිළිපදියි. | 5.1 පුද්ගලික පිරිසිදුකම<br>• ශාරීරික පිරිසිදුකම (නෑම)<br>• ඇඳුම්වල පිරිසිදුකම<br>• භාවිතා කරන ද්‍රව්‍ය<br>• වැසිකිලි භාවිතය |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| | 5.2 දෛනික ජීවිතයේ දී මුස්ලිම්වරු පිළිපැදිය යුතු යහපත් සෞඛ්‍ය පුරුදු අඛණ්ඩ ව පිළිපදියි. | 5.2 • පාරිසරික පිරිසිදුකම<br>• මහා මාර්ග/පාරවල්/පොදු ස්ථාන |
| **6.0 අහ්ලාක් සහ අදාත් දෛනික ජීවිතයේ දී පිළිපැදීම** | 6.1 පිළිපැදිය යුතු යහ ගුණයන් අනුගමනය කරයි | 6.1 වැඩ පිළිවෙළ<br>• වගකීම් හා<br>• අදාළ වේලාවේ ඉටුකිරීම<br>• හොඳින් ඉටුකිරීම |
| | 6.2 සාමූහික ජීවිතයට අදාළ ගුණධර්ම හා සාරධර්ම (අහ්ලාක් හා අදාත්) පිළිපදියි. | 6.2 යහ ගුණයන්<br>• ආදරය දැක්වීම හා කීකරුවීම<br>• වැඩිහිටියන්<br>• මිතුරන්<br>• නෑදැයින් |
| | 6.3 සාමූහික ජීවිතයට අදාළ ගුණධර්ම හා සාරධර්ම (අහ්ලාක් හා අදාත්) පිළිපදියි. | 6.3 දන්පින් කිරීම / සදකා කිරීම<br>• අන්අයට සැලකීම<br>• සන්හිඳියාව<br>• ඇත්ත කතා කිරීම, දරාගැනීම අන් අයට උදව් කිරීම |
| **7.0 නබි (සල්) තුමාණන් ගේ ආදර්ශ** | 7.0 නබි (සල්) තුමාණන් කෙරෙහි සෙනෙහසින් එතුමා ගේ ආදර්ශ පිළිපදිමින් ජීවත් වෙයි. | 7.1 නබි (සල්) තුමාගේ<br>• ළමා කාලය<br>• යහගුණායන් |
| **8.0 ඉස්ලාමීය ඉතිහාසය** | 8.0 ඉස්ලාමීය ඉතිහාසයේ බිහි වූ විද්වතුන් ගේ ප්‍රතිපත්ති අගය | 8.1 ඉමාම් අබූ හනීෆා (රහ්) තුමාගේ යහගුණයන් |

## 1.0 තේමාව : අල්ලාහ් සිටින බව පිළිගෙන සෑම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි.

**නිපුණතාව 1.0** : **අල්ලාහ් සිටින බව පිළිගෙන සෑම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි.**

**නිපුණතා මට්ටම 1.1** : • අල්ලාහ් සිටී යන්න පිළිගෙන සෑම අවස්ථාවකම ඔහු සිහිපත කරමින් ක්‍රියාකරයි.

**ඉගෙනුම් පල** :
- අල්ලාහ් සෑම මැවීමකට ම ආහාර ලබා දෙයි යන්න පිළිගෙන පවසයි
- අල්ලාහ් සියළු මැවීම්වලට සියලු පහසුකම සලසා දී ඇත යන්න පිළිගෙන පවසයි
- අල්ලාහ් සෑම මැවීමක්ම මවා එය පාලනය කරන ආකාරය පැහැදිලි කරයි
- අල්ලාහු කාලිකුනා, අල්ලාහු රාසිකුනා යන ගීතයට සවන් දී ලස්සනට ගායනා කරයි

**ඉගෙනුම් සම්පත්** :
- අර් රස්සාක් යැයි ලියන ලද පත්‍රිකාවක්
- මැවීම්වලට ආහාර ලබා දී පෝෂණය කරන ආකාරය පෙන්නුම කරන රූප

  උදා : වර්ෂාවෙන් පසු තණකොළ වැඩීම
  ගස්වැල් සරුවට වැඩි, එල දැරීම
  කුඹුරේ වී වැවී තිබීම සතුන් කිරි පෙවීම, පක්ෂීන් හට ආහාර දීම

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- සිසුන් අවට පරිසරයට කැඳවා ගෙන යන්න
- අල්ලාහ්ගේ මැවීම් කෙසේ පෝෂණය වන්නේද යන්න නිරීක්ෂණය කරමින් සාකච්ඡා කරන්න
- කෘමීන්, පක්ෂීන්, සතුන්, ගස්වැල් කෙසේ විවිධාකාර අන්දමින් පෝෂණය වන්නේ දැයි විස්තර කරන්න
- ඒවායේ ඔවුන්ගේ ආහාර ක්‍රමයන් වෙන්කර කර හඳුනා ගනිමින් සාකච්ඡා කරන්න
- සෑම මැවීමකටම ආහාර පාන ලබා දී පෝෂණය කරන්නේ - අර්රස්සාක් අල්ලාහුතආලා යන්න ගෙන හැර දක්වන්න
- ඒ සියල්ල ක්‍රමානුකූලව සිදුවන බවද ගෙන හැර දක්වන්න
- සුළඟ, ජලය, හිරුඑළිය, පස් වැනි දේ මේ සඳහා මවා ඇති බව පැහැදලි කරන්න
- සිසුන් සමග සාකචඡා කර වැඩි විස්තර ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 2**

- සිසුන් පන්ති කාමරයෙන් එළිමහනට ගෙන එන්න.
- අල්ලාහු කාලිකුනා, අල්ලාහු රාසිකුනා, අල්ලාහු හාදීනා, සුබ්හාන මව්ලානා
  "අල්ලාහ් අපව මැව්වේය
  අල්ලාහ් අපට ආහාරපාන ලබා දෙන්නේය
  අල්ලාහ් අපට යහ මග පෙන්වා දෙන්නේය
  පාරිශුද්ධය හිමියාණෙනි..."
- "අල්ලාහ් අපගේ මැවුමකරුවා ය"
- එමෙන්ම ඔහු අපට ආහාරපාන ලබා දෙයි. අපේ කෙසේ ජීවත්විය යුතුද යන්න කියා දෙයි. ඒ

වෙනුවෙන් අපි අල්ලාහ්ට ප්‍රශංසා කරමු. එමෙන්ම ස්තුතිවන්ත වෙමු. යන්න ගීතයේ අර්ථ බව දක්වා සිසුන් සමග සාකච්ඡා කරන්න.

තක්සේරුව

- අල්ලාහ් රස්සාක් බව විස්තර කර කියයි
- අල්ලාහ් මැවුම්කරුවා යන්න පවසයි
- පාලනය කරන්නා අල්ලාහ් යන්න ප්‍රශංසා කරයි
- රස්සාක් යැයි ප්‍රශංසා කරයි

## 2.0 තේමාව : අර්කානුල් ඊමාන් පිළිබඳව දැන පවසයි.

**නිපුණතාව 2.0** : **අර්කනුල් ඊමාන් පිළිබඳ වටහාගෙන තමා ද ක්‍රියාත්මක වී අනෙකුත් අයට ද පවසයි.**

**නිපුණතා මට්ටම 2.1** :
- මලාඉකාවරුන් පිළිබඳ දෙන ගැන පවසයි.
- ඔවුන්ගේ කාර්යාරය දෙන පවසයි.

**ඉගෙනුම් පල** :
- කලිමතුන් තමජිදය කටපාඩම් කර විධිමත්ව උච්චාරනය කරයි
- සුබ්හානල්ලාහ්, අල්හම්දුලිල්ලාහ්, අල්ලාහු අක්බර් යන වචනයන් හරියාකාරව උච්චාරණය කරයි.
- දෛනික ජීවිතයේ දී මෙම වචනයන් සුදුසු අවස්ථාවන් හි බාවිත කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- සුබහානල්ලාහ්, අල්හම්දුලිල්ලාහ්, අල්ලාහු අක්බර් යන වචන ආරාබියෙන් වෙන් වෙන්ව ලියූ කාඩ්බෝඩ් පත්‍රිකාවන්
- කලිමා තම්ජීද් අරාබියෙන් ලියන ලද කාඩ්බෝඩ් පත්‍රිකාව
- එහි අර්ථය ලියා ඇති කාඩ්බෝඩ් පත්‍රිකාව

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- සිසුන් පන්ති කාමරයෙන් පිටතට ගෙන යන්න සකස් කර ඇති වචන පත්‍රිකා ද රැගෙන යන්න
- සුබහානල්ලාහ්, අල්හම්දුලිල්ලාහ්, අල්ලාහු අක්බර් යනාදී වචන භාවිත වන අවස්ථා පැහැදිලි කරන්න

  උදා : පස් වේල් සලාතයෙන් අනතුරුව 33 වරක් කීම ආශ්චර්යමත් යමක් ඇසුනු විට, අල්ලාහ්ට ස්තුති වන්ත වන විට සහ යහ ක්‍රියාවන් දකින විට
- මෙසේ සිසුන්ගේ ජීවිතයේ භාවිතා කල හැකි අවස්ථාවන් ගොනු කර ගන්න

  උදා : පාසලේ සිසුවෙකු තෑගි ලබා ගන්න විට - අල්ලාහු අක්බර් එය දෙමාපියන් හට දැනුම් දෙන විට - අල්හම්දුලිල්ලාහ්
- පාසලේ පුදුම සහගත යමක් අරංචි වූ විට - සුබ්හානල්ලාහ්

**ක්‍රියාකාරකම 2**

- සිසුන් පන්ති කාමරයෙන් පිටතට ගෙන යන්න
- කලිමා තම්ජීද් හා එහි අර්තය ලියා ඇති පත්‍රිකා ද ගෙන යන්න
- පන්තිය දෙකට බෙදා එක් කණ්ඩායම කලිමා ද අනෙක් කණ්ඩායම එහි අර්ථය ද මාරුවෙන් මාරුවට පැවැසිමට මග පාදන්න
- පසුව තනි තනිව මෙසේ පැවසීමට මග පදාන්න
- පසුව වචන වෙන් කර එක් එක වචනයන්හි අර්තය වෙන් කර පැහැදිලි කරන්න
- සිසුන් කිහිප දෙනෙකුට කැඳවා මෙම වචන වල අර්ථය අසන්න (කලිමාවේ වචන ආකාරයට නැතිව තැනින් තැනට)

## 2.0 තේමාව : අර්කානුල් ඊමාන් ගැන දැන පවසයි.

**නිපුණතාව 2.0** : **අර්කනුල් ඊමාන් පිළිබඳ අවබෝධ කරගෙන තමා ද ක්‍රියාත්මක වී අන් අයට ද පවසයි.**

**නිපුණතා මට්ටම 2.2** : • මාලාඉකාවරුන් විශ්වාස කර පිළිගනියි

**ඉගෙනුම් පල** :
- මලාඉකාවරුන් දස දෙනාගේ නම හරියාකාරව උච්චාරණය කරයි
- එක් එක් අයගේ නම් හා ඔවුන්ගේ කාර්‍යභාරය වෙන වෙන්ව පවසති
- ඔවුන් සුවිශේෂී මැවීම් යන්න දැන පවසයි
- මලාඉකාවරුන් දස දෙනාගේ නම සඳහන් ගීතයක් ගායනා කරයි

**ඉගෙනුම් සම්පත්** : • මලාඉකාවරුන්ගේ නම් හා කාර්යභාරයන් වෙන වෙනම ලියන ලදපත්‍රිකාවන්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- සිසුන්ට සදුසු බාහිර පරිසරයකට කැඳවා ගෙන යන්න
- පිරිසිදු ස්ථානක අසුන් ගැනිමට සලස්වන්න
- මලාඉකාවරුන් දස දෙනාගේ නම හා ඔහුලේ කාර්‍යභාර්ය ලියන ලද පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න
- මලාඉකාවරුන් දස දෙනාගේ නම් හරියාකාරව උච්චාරණය කිරීමට මග පාදන්න
- සිසුන් කණ්ඩායම් දෙකට බෙදා එක කණ්ඩායමක් මලඉකාවරුන්ගේ නම් ද අනෙක් කණ්ඩායම ඔවුන්ගේ කාර්‍යයන් ලියන ලද පත්‍රිකා ලබා දී අදාළ පරිදි පෙන්වීමේ අභ්‍යාසය ලබා දෙන්න
  උදා : එක් කණ්ඩායම කබ්රයේ ප්‍රශ්න අසන්නා යන පත්‍රිකාව ඔසවන විට
  අනෙක් කණ්ඩායම මුන්කර් නකීර් පත්‍රිකාව ඔසවා පෙන්වයි.
- සුදුසු වෙනත් ක්‍රියාකාරකම් ද යොදාගත හැක.

**ක්‍රියාකාරකම 2**

- පහත සඳහන් කවිය, මිහිරිව ගායනා කිරීමට හුරු කරන්න.

අල්ලාහ්ගේ පණිවුඩ නබිවරුන්ට
යහමින් ගෙන යන්නේ ජිබ්රීල් වේ
සුලග වර්ෂාව භාරව
ක්‍රියාකරන්නා මීකායීල් වේ
සූර් නලාව පිඹිනා මලාඉකා
කවුරුන් වෙන නොව ඉස්රාෆීල්
මනිසුන්ගේ ප්‍රාණය අත්පත් කර ගන්නා
භාරව සිටින්නන්
කවුරුන් වෙන නොව මුන්කර් නකීර්
මිනිසුන් කරනා යහ ක්‍රියාවන්
ලියනා මලාඉකා රකීබ් වේ
වැරදියන් ලියන්නේ අතීද් වේ
නිරයේ අධිපති මාලික් වේ
ස්වර්ගයේ අධිපති රිල්වාන් වේ
මේ සැම විශ්වාස කරමු සදා...

ක්‍රියාකාරකම් 3

- මලාඉකාවරුන් දස දෙනාගේ නම ලියන ලද වෙන් වෙන් ව පත්‍රිකා සකස් කර ගන්න
- සිසුන් දස දෙනෙකුට එය සඟවා තබා ගන්නා ලෙස දෙන්න
- ගීතය ගායනා කරන විට අදාල මැලක්වරයාගේ නම පවසන විට පත්‍රිකාව ඔසවා පෙන්වන ලෙස හුරු කරන්න.
- මෙසේ මාරුවෙන් මාරුවට කිරීමෙන් මලක්වරු දස දෙනාගේ නම කට පාඩම් කිරීමට හුරු කරන්න.

තක්සේරුව -

මලාඉකාවරු දසදෙනාගේ නම් කියයි

මලාඉකාවරු දසදෙනාගේ කාර්යභාරය පවසයි

මලාඉකාවරු දසදෙනාගේ නම් හා ඒ අයත් කාර්යයන් ගලපා කියයි

## 3.0 තේමාව: අල් කුර්ආනය දැන පාරායනය කිරීම.

**නිපුණතාව 3.0 :** අල්කුර්ආනය විශ්වාස කර දැන එය පාරායනය කරන අතර එහි උපදේශයන් ද පිළිපදියි

**ඉගෙනුම් පල :**
- අල් කුර්ආනය ආගමික ග්‍රන්ථයක් යන්න පවසයි
- එය අල්ලාහ්ගෙන් නබි (සල්) තුමාට පහළ කරන ලද බව පවසයි
- පාරායනය කිරීමේදී මෙන්ම එයට සවන් දීමෙන් ද කුසල් ලැබෙන බව පවසයි
- අල් කුර්ආනය ගෞරවයෙන් පරිහරණය කරයි
- පිරිසිදු සිරුරෙන් යුක්තව එය පරිහරණය කරයි
- එහි අවවාද පිළිගෙන කටයුතු කරයි

**ඉගෙනුම් සම්පත් :**
- අල්කුර්ආන් ග්‍රන්ථයක්, ගැසට්පටිය හා සීඩී

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- සිසුන් පන්තියෙන් පිටතට කැඳවා ගෙන යන්න
- පිරිසිදු තැනක අසුන් ගන්වන්න
- අල් කුර්ආන් ග්‍රන්ථ පිටපත පෙන්වා පහත සඳහන් දේ හඳුන්වා දෙන්න
- මෙය අපගේ ආගමික ග්‍රන්ථයයි
- මෙය අල්ලාහ්ගෙන් නබි (සල්) තුමාණන් හට පහළ වූවකි
- මෙය අරාබි භාෂාවෙන් ඇත
- මෙම ග්‍රන්ථය ඉතා පිරිසිදුව (වුළු සමග) පරිහරණය කළ යුතුය
- මෙය පාරායනා කිරීමෙන් මෙන්ම සවන් දීමෙන් ද කුසල් ලැබෙනු ඇත
- මෙය ශුද්ධ වූ ග්‍රන්ථයකි. මෙය හොඳින් අවබෝධ කර ක්‍රියා කිරීමේ දී පමණක් ජය අත්වේ.

**ක්‍රියාකාරකම 2**

- සිසුන් රවුමට අසුන්ගන්වන්න
- පහත සඳහන් ප්‍රශ්න අසමින් අදහස් හුවමාරු කරගන්න
- ඔබගේ නිවසේ අල්කුර්ආන් පිටපතක් තිබේද?
- ඔබගේ නිවසේ අල්කුර්ආන් පාරායනා කෙරෙන්නේ ද?
- ඔබට අල් කුර්ආනය පාරායනා කළ හැකිද?
- ඔබ නිතර පාරායනා කරන්නේද?
- මොන වෙලාවන්හිද ඔබ පාරායනා කරන්නේ?
- පාරායනා කිරීමට නොදන්නේ නම් . . .
  එය පාරායනා කිරීමට කුමන උත්සාහයන් ගන්නවාද?

- ගුරුතුමා අල් කුර්ආනය පාරායනා කර පෙන්වීම නැතහොත් CD මගින් සවන් දීමට සැලැස්වීම
- අල් කුර්ආනය පාරායනා කළ යුත්තේ මක්නිසාද යන ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.
  එය අපගේ ආගමික ග්‍රන්ථය
  අපට මගපෙන්වීම සඳහා එය පහළ කර ඇත
  එහි උපදෙස් අනුව ජීවත්විය යුතුය
  එය අපි වෙනුවෙන් සාක්ෂි දෙන්නේය

ඒ පිළිබඳ ප්‍රශ්න කරනු ලබන්නේය.
ඉහත කරුණු පිළිබඳ සාකච්ඡා කරන්න
ක්‍රියාත්මක කළ හැකි සමහර ආයතයන් උදාහරණ වශයෙන් කියා දෙන්න
උදා: වත්තකුල්ලාහ් -අල්ලාහ්ට බියබැති වන්න
රබ්බි සිද්නි ඉල්මා - යා අල්ලාහ් මාගේ දැනුම වර්ධනය කරනුමැනවි

**ක්‍රියාකාරකම 3**

- සිසුන් වුලූඋ කර ගෙන එන මෙන් පවසන්න
- අල් කුර්ආන් පිටපත් රැගෙන එන මෙන් දන්වන්න
- පාරායනා කළ හැකි සිසුවෙකු ලවා අල් කුර්ආනය මිහිරිව පාරායනා කරවන්න
- එයට සවන් දීමට අනෙක් සිසුන්ට ඉඩ සලසන්න
- පහත සඳහන් දේ නිරීක්ෂණය කරන්න

- අල් කුර්ආනය ගෞරවාන්විතව පරිහරණය කිරීම
- විවෘත කළ විගස සිප ගැනීම
- අත් දෙකෙන්ම අල්ලා සිටීම
- අඌදු බිස්මි පැවැසීම
- පාරායනා කරන විට අනෙක් අය සාවධානව සවන් දීම
- මහ්රජ් - ශබ්ද හරියාකාරව උච්චාරණය කිරීම
- නිවැරදිව පාරායනා කිරීම

- පාරායනා කර අවසන් වීමෙන් අනතුරුව නැවත සමීක්ෂණය
- පාරායනා කළ සිසුවාගෙන් කරුණු විමසන්න
- අනෙකුත් සිසුන්ගෙන්ද කරුණු විමසන්න
- ගුරුභවතා කරුණු ඉදිරිපත් කරන්න
- පාරායනා කළ සිසුවා ද අනෙක් සිසුන්ද උනන්දු කරවන්න

**තක්සේරුව :**

- අල්කුර්ආනය අවසාන ආගම බව පවසයි
- අල්කුර්ආනය පාරායනය කළ යුත්තේ ඇයි යන්න පවසයි
- පිරිසිදුව සිටිමින් අල්කුර්ආනය පරිහරණය කරයි
- අදාළ මක්රජ් මතුකරමින් පාරායනය කරයි
- සන්සුන්ව හා මිහිරිව අල්කුර්ආනය පාරායනය කරයි

## 4.0 තේමාව: අර්කානුල් ඉස්ලාම් ගැන දැන පවසයි

**නිපුණතාව 4.0** : සලාතය වුලූඃ යනාදිය දූන අනුගමනය කරයි

**ඉගෙනුම් පල** :
- සලාතය ඉටුකළ යුතුය යන්න අවබෝධ කර ක්‍රියා කරයි
- සලාතයේ වේලාවන් දැන පවසයි
- සලාතය ඉටු කරන ආකාරය දැන ඉටු කරයි

**ඉගෙනුම් සම්පත්** :
-

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1

- සිසුන් ලුහර් සලාතය සඳහා මස්ජිදයට හෝ වෙනත් සුදුසු ස්ථානයකට කැඳවාගෙන යන්න
- අදාන් පැවසීමෙන් අනතුරුව වැඩිහිටියන් සුන්නත් සලාතය ඉටු කරන අයුරු නිරීක්ෂණය කරනමෙන් උපදෙස් දෙන්න
- පසුව ජමාඅත් සමග සලාතය ඉටු කිරීමට මග සලස්වන්න
  සලාතය ඉටු කිරීමෙන් අනතුරුව මස්ජිදයේ ස්ථානයක හෝ පන්ති කාමරයේ සලාතය ඉටු කළ යුතු ආකාරය පිළියෙල සාකච්ඡා කරන්න
- තනිව සලාත් කිරීම හා ජමාඅත් සමග ඉටු කිරීම අතර තිබෙන වෙනස කෙටියෙන් කියා දෙන්න
- සිසුන් සමග සාකච්ඡා කර ඔවුන්ගේ අදහස්වලට කන් දී සුදුසු පරිදි නිවැරදි කරන්න
- දෛනිකව සලාතය ඉටු කිරීමට උනන්දු කරවන්න

තක්සේරුවඃ-

- සලාතයට අදාළ වක්තයන් හඳුන්වයි
- එක් එක් වක්තයකම රක්අත් පවසයි
- වුලූඃ හි මූලික කරුණු සියල්ල ගැන සළකා වුලූඃ ඉටුකරයි
- උනන්දුවෙන් සලාතයේ යෙදෙයි

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**
- ජීවිතයේ විවිධ අවස්ථාවන් හි පිරිසිදුකම රැක ගැනීමට වග බලා ගනියි.
- ඉස්ලාමීය යහ පුරුදු පිළිපදියි.

## 4.0 තේමාව: අර්කානුල් ඉස්ලාම් ගැන දැන පවසයි

**නිපුණතාව 4.0** : අර්කානුල් ඉස්ලාම් විශ්වාස කරමින් පිළිපදියි

**නිපුණතා මට්ටම 4.2** : • සූරතුල් ෆාතිහාව වනපොත් කොට පාරායනය කර පෙන්වයි

**ඉගෙනුම් පල** :
- සූරා ෆාතිහාව නිවැරදිව පාරායනා කර පෙන්වයි
- සූරා ෆාතිහාව කටපාඩම් කර එය දෛනික සලාතයන්හි උසුරයි.

**ඉගෙනුම් සම්පත්** : • (සූරා ෆාතිහා) ව ලියන ලද කාඩ්බෝඩ් පුවරු, සූරා ෆාතිහාව පාරායනා කෙරෙන සීඩි තැටි

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- සිසුන් පන්ති කාමරයෙන් පිටතට කැඳවාගෙන යන්න
- සූරා ෆාතිහාව සම්පූර්ණයෙන්ම පාරායනා කර පෙන්වන්න
- එය සාවදානව සවන් දීමට ඉඩ සලසන්න
- එක් එක් වාක්‍ය බැගින් පාරායනා කිරීමට ඉඩ සලසන්න
- පාරායනා කිරීම සවන් දීමෙන් හා පත්‍රිකාව බලා කියවීමෙන් සූරා ෆාතිහාව කටපාඩම් කිරීමට උදව් කරන්න
- ගුරුවරයා හා සිසුන් සැවෝම එකවර පාරායනා කරන්න
- හොඳින් පාරායනා කළ හැකි සිසුවෙකු ලවා පාරායනා කරවන්න
- එක් එක් වාක්‍යයන් තැනින් තැන අසමින් පාරායණා කරන්න
- සැවෝම එකට පාරායණා කරන්න
- සූරා ෆාතිහාවෙහි වැදගත්කම පැහැදලි කරන්න
  උදා:- උම්මුල් කුර්ආන් : එක් පාරායනා නොකළහොත් සලාතයේ ඉටු නොවේ
  සිසුන් සැවෝම කට පාඩම් කිරීමට මගපාදන්න

තක්සේරුව:

- සූරතුල් ෆාතිහාව සම්පූර්ණයෙන්ම පාරායනය කර පෙන්වන්න
- සූරතුල් ෆාතිහාව කටපාඩමින් පාරායනය කරයි
- සුදුසු අවස්ථාවල සූරතුල් ෆාතිහා පාරායනය කරයි

## 4.0 තේමාව : අර්කානුල් ඉස්ලාම් ගැන දැන පවසයි

**නිපුණතාව 4.0** : අර්කානුල් ඉස්ලාම් විශ්වාස කරමින් පිළිපදියි

**නිපුණතා මට්ටම 4.3** : • සලාතයේ පාරායනාවන් නිවැරදිව පාරායනය කරයි

**ඉගෙනුම් පල** : • අත්තහියියාතය නිවැරදිව පාරායනා කර පෙන්වයි
• අත්තහියියාතය කටපාඩම් කර සලාතයේදී උසුරයි.

**ඉගෙනුම් සම්පත්** : • අත්තහියියාතය ලියන ලද කාඩ්පත්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

- සිසුන් පන්තියෙන් පිටත කැඳවාගෙන යන්න
- අත්තහියියාතය (ෆර්ල් වූ කොටස) පාරායනය කර පෙන්වන්න
- සිසුන් සාවදානව සවන් දීමට මග පාදන්න
- එක් එක් වාක්‍ය බැගින් කියවා සිසුන්ව එය අනුගමනය කරවන්න
- කියවන අතර තුරේදී සිසුවෙකු ලවා අතේ කෝටුවක් දී උච්ඡාරණය කරන වචනයට සමාන ස්ථානය ලියූ පත්‍රිකාව මත තබමින් අනුගමනය කිරීමට ඉඩ සලසන්න
- සිසුන් නිවැරදිව කටපාඩම් කිරීමට හා කට පාඩම් කළ කොටස හරියාකාරව උච්ඡාරණය කිරීමට සිසුවන් මාරුවෙන් මාරුවට අසුන් ගන්වා පුරුදු කරන්න.
- අතරින් පතර ගුරුතුමාද කියවා සිසුන්ට ද එසේ කියවීම හුරු කරන්න
- තැනින් තැන වචන හුවමාරු කර හඳුනා ගැනීමට පොදුවේ සැමදෙනාටම විශේෂයෙන් තනි තනිවද හුරු කරන්න
- සූරා ෆාතිහාව මෙන් අත්තහියියාතය ද සලාතයේ අනිවාර්‍යයෙන් ඉසිරිය යුතුය යන්න පවසා කටපාඩම් කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න. නිවැරදිව කටපාඩම් කිරීමට අවධාරණය කරවන්න.
- පහසුවෙන් කටපාඩම් කිරීමට දක්ෂ සිසුන් එක් එක් කණ්ඩායම් වලට යොදවා ඔවුන් මගින් අත්තහියියාතය කටපාඩම් කිරීමට මග පාදන්න

තක්සේරුව:

- අත්තහියාතය සම්පූර්ණයෙන් පාරායනය කරයි
- අත්තහියාතය නිවැරදි උච්චාරණය සහිතව පාරායනය කරයි
- අත්තහියාතය කටපාඩමින් පාරායනය කරයි

## 5.0 තේමාව : අත්තහාරා පිළිබඳ අවබෝධය ලබාගැනීම

**නිපුණතාවය 5.1** : • දෛනික ජීවිතයේ මුස්ලිම්වරු අනිවාර්යයෙන් පිළිපැදිය යුතුය. සෞඛ්‍යමය පිළිවෙත් දැන අනුගමනය කරයි.

**ඉගෙනුම් පල** :
- සැමවිට දිය නා තම ඇඳුම් පිරිසිදුව තබා ගනියි.
- තමා අඳින ඇඳුම් පිරිසිදුව තබා ගනියි.
- තමා භාවිත කරන ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව හා පිළිවෙලකට තබා ගනියි.
- වැසිකිළි පිරිසිදුව තබයි
- මළපහ පිරිසිදු කරන ආකාරය පිළිවෙලකට කරයි.
- උචිත අවස්ථා වල දුආ උසුරයි.

**ඉගෙනුම් සම්පත්** :
- සුදුසු පින්තූර, දුආ ලියූ කාඩ්පත්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- දෛනිකව දියනා පිරිසිදුව සිටින්නෙකු පිළිබඳ සිසුන්ගේ අදහස් විමසන්න.
- සතියකට වරක් පමණ දිය නා පිරිසිදු වන්නෙකු පිළිබඳව සිසුන්ගෙන් අදහස් විමසන්න.
- ඉහත කී දෙදෙනාගෙන් ජනතාවට වඩාත් ප්‍රියතම පුද්ගලයා කවුරුන්දැයි සිසුන්ගෙන් විමසන්න.
- දිනපතා දිය නෑමේ ඇති වැදගත්කම අවධාරණය කර එක් මුස්ලිම්වරයෙකු දෛනිකවම තමාගේ ශරීරය පිරිසිදුව තබා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- ඉහත කරුණු සනාථ කරවන අල් කුර්ආන් වැකියන් හා හදීසයන් රැස් කර සිසුන් හට ප්‍රදර්ශනය කරන්න.

ක්‍රියාකාරකම 2

- පිරිසිදු ඇඳුමක් හා අපිරිසිදු ඇඳුමක් ගෙනවිත් සිසුන් හට ප්‍රදර්ශනය කරන්න.
- එම දෙස බලන විට සිසුන් තුළ ඇති වන්නාවූ හැඟීම් ප්‍රකාශ කිරීමට ඉඩ සලසන්න. ඔවුන් ට නිවැරැදි මග පෙන්වන්න
- ඔවුන් ප්‍රකාශ කළ හැඟීම් අතරින් සිත ප්‍රිය කරන හැඟීම් තෝරා ඒවායේ හේතුව අවබෝධ කර පවසන්න.
- ඇඳුම් පිරිසිදුව තබා ගැනීමෙන් අත්වන යහපත් ප්‍රතිඵල පිළිබඳ කරුණු ලැයිස්තුගත කිරීමට මග සලසන්න.
- තමාගේ ඇඳුම් සැමවිටම පිරිසිදුව තබා ගැනීමේ වැදගත්කම අල් කුර්ආන්, සුන්නා ආධාරයෙන් පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 3**

- ක්‍රියාකාරකම 03
- සිසුන් ගෙදර දී හා පාසලේදී වැඩියෙන් භාවිත කරන දේවල් අලවා ඇති බ්‍රිස්ටල් බෝඩ් පත්‍රය ප්‍රදර්ශනය කරන්න.
- ඒවාහි නිතර නිතර භාවිත කරන හා විටින් විට අවශ්‍යය අනුව භාවිත කරන ද්‍රව්‍ය වෙන් කර පෙන්වීමට කියා දෙන්න.

- එම දේවල් කෙසේ අපිරිසිදුවන්නේ දැයි අසා එම දේවල් අපිරිසිදු වීම වලක්වා පිරිසිදුව තබා ගන්නේ කෙසේ දැයි සිසුන් පැවසීමට මග පාදන්න.
- එසේ අපිරිසිදු වී කිළිටි වී ඇති දේවල් පිරිසිදු කරන්නේ කෙසේ දැයි සිසුන්ගෙන්ම අසා ඔවුන්ට හරි මග දැනුවත් කරන්න.
- සිසුන් භාවිත කරන එක් එක් ද්‍රව්‍යය අතට ගෙන එය කෙසේ පිරිසිදුව තබා ගන්නේ ද යැයි අසා ඔවුනට නිවැරැදිව මග පෙන්වා දෙන්න.
  උදා : පොත් බෑගය, අභ්‍යාස පොත්, පනාව, තුවාය, පුටුව, මේසය, ලේන්සුව යනාදී

ක්‍රියාකාරකම් 4

- වැසිකිළිය භාවිතා කරන අවස්ථාවේ සිසුන් පිළිපැදිය යුතු පිළිවෙලත් පිළිබඳ සිසුන් පැවසීමට මගපාදන්න.
- වැසිකිළියේ උසුරන දූආවන් ලියූ පත්‍රිකාව ප්‍රදර්ශනය කර නැවත නැවත අවධාරණය කරන්න.

තක්සේරුවඃ

- පිරිසිදුකම සුරකියි
- තම පරිසරය පිරිසිදුව තබාගනියි
- තමා භාවිත කරන ද්‍රව්‍ය පිළිවෙලට සුරකියි

## 5.0 තේමාව : අත්තහාරා පිළිබඳ අවබෝධය ලබා ගනියි

**නිපුණතා මට්ටම** 5.2 : • එදිනෙදා ජීවිතයේ මුස්ලිම්වරුන් පිළිපැදිය යුතු සෞඛ්‍යමය පිළිවෙත් පිළිබඳ දැනුවත් වී එය තමාගේ දෛනික ජීවිතයේ අනුගමනය කරන්න.

**ඉගෙනුම් පල** :
- තමාගේ පරිසරය සැමවිටම පිරිසිදුව හා අලංකාරව තබා ගනියි.
- පරිසරය පිරිසිදු කිරීමේ ක්‍රියාවලින් හිදී තමාද සහභාගී වෙයි.
- මහමග හා පොදු ස්ථානවල කුණු දැමීමෙන් වැළකී සිටීම.
- පොදු ස්ථාන පිරිසිදු කිරීමේ වැඩසටහන්වල තමාද දායක වෙයි.

**ඉගෙනුම් සම්පත්** :
- ඉතා පිරිසිදු ලස්සන පරිසරයක් ඇතුළත් වර්ණ ඡායාරූපයක්
- පරිසරය පිරිසිදු කරන අවස්ථා, ශ්‍රමදාන කරන අවස්ථාවන් වල පින්තූර
- පොදු ස්ථාන අලවා ඇති බ්‍රිස්ටල් බෝඩ් පත්‍රිකාව උදා: (මස්ජිදය, මල් වත්ත, රෝහල, පාසල, පුස්තකාලය, තැපැල් කන්තෝරුව, දුම්රිය ස්ථානය, බස්නැවතුම් පොළ)

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය**

**ක්‍රියාකාරකම 1**
- මහ මාර්ග පිරිසිදුව තබා ගැනීමෙන් අපට අත්වන යහ එල මොනවාදැයි සිසුන් පැවසීමට මග සලසන්න.
- මිනිසාගේ කුමන ක්‍රියා කලාපයන් නිසා මෙම මහ මාර්ග අපවිත්‍ර වන්නේ දැයි සිසුන් දැන සිටින කරුණු ඉදිරිපත් කිරීමට මග පාදන්න.
- එම කරුණු කළු ලෑල්ලේ ලියා පසුව ඒ පිළිබඳ තව තවත් විස්තර කරන්න.
- මහා මාර්ග පිරිසිදුව තබා ගැනීම පිළිබඳ අවධාරණය කරන ඉස්ලාමයේ උපදේශයක් තෝරා ඉදිරිපත් කරන්න.
- මහ මාර්ග පිරිසිදුව තබා ගැනීමේ කර්තව්‍යයට දායක වන්නන්ට පරලොව දී ලැබෙන ප්‍රතිඵල පිළිබඳ විස්තර කරන්න.
- මහ මාර්ග සැමවිට පිරිසිදුව තබා ගැනීමට කුඩා දරුවන් අපට දායක විය හැකියි එය කෙසේ දැයි සාකච්ඡා කරන්නේ කරුණු ඉදිරිපත් කරන්න

**ක්‍රියාකාරකම 2**
- "පොදු ස්ථාන'' පිළිබඳ සිසුන්ගෙන් විමසන්න. ඒවා කළුලෑල්ලේ ලියා ගන්න.
- කලින් සකස් කරන ලද පොදු ස්ථාන පත්‍රිකාව සිසුන්ට ප්‍රදර්ශනය කරන්න
- එම එක් ස්ථානය පන්තියේ ඇති එක් එක් කණ්ඩායමට බෙදා දී සාකච්ඡා කිරීමට ඉඩ සලසන්න

කණ්ඩායම 01 : රෝහල
02 - දුම්රිය ස්ථානය
03 - මස්ජිදය
04 - ක්‍රීඩාංගනය
05 - පොදු ගමනා ගමන වාහන

- එක් එක් කණ්ඩායමක් ඉහත කී පොදු ස්ථාන කෙසේ පිරිසිදුව හා අලංකාර ව තබා ගන්නේ දැයි සාකච්ඡා කර සටහන් කිරීමට මග සලසන්න
- පාසලේ සලාත් කරන කාමරයට නැතහොත් පුස්තකාලය සිසුන්ව ගෙන ගොස් ඒවා පිරිසිදු කර අලංකාරව තබන ක්‍රියාවන් හි ඔවුන්ට යොදවන්න

තක්සේරුව:

- පොදු ස්ථාන අපිරිසිදු කිරීමෙන් වැළකී සිටීම.
- පොදු ස්ථාන පිරිසිදුව තබා ගැනීම.
- පොදු ස්ථාන පිරිසිදු කිරීමේ කටයුතුවලට සහාය වීම.

## 6.0 තේමාව : අඛ්ලාක් හා අදාත් දෛනික ජීවිතයට අවශ්‍ය ලෙස පිළිපදියි.

**නිපුණතාව** : **සාමූහික ජීවිතයට අදාළ ගුණධර්ම හා සාරධර්ම (අඛ්ලාක් හා අදාත්) පිළිපදියි.**

**නිපුණතා මට්ටම 6.1** :
- එදිනෙදා ජීවිතයේ මුස්ලිම්වරු අනුගමනය කළ යුතු සෞඛ්‍යමය පිළිවෙත් දැන පිළිපදියි

**ඉගෙනුම් පල** :
- ගෙදරදී ගෙදරින් බැහැර ව සිටින අවස්ථාවන් වල සිය යුතුකම් හරියාකාරව ඉටු කරයි.
- එදිනෙදා කලයුතු ක්‍රියාවන් නියමිත වේලාවටම ඉටු කිරීම පුරුද්දක් කර ගනී.
- කරන දේ මැනවින් කිරීමට උත්සාහ කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- යුතුකම් ඉටු කිරීම පිළිබඳ අල් කුර්ආන් වැකි, හදීස් ආධාර කවි කථා

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- සිසුන් ගෙදර කරන යුතුකම් පිළිබඳ කතා කිරීමට ඉඩ සලසති.
- පාසලේ හා පන්ති කාමරයේ ඔවුන් ඉටු කරන යුතුකම් පිළිබඳ කතා කිරීමට සලස්වන්න.
- ගෙදර හා පාසල තුළ යුතුකම් හරියාකාරව ඉෂ්ඨ කරන්නන් කව්දැයි විමසා, ඔවුන් අතරින් යුතුකම් හරියට ඉෂ්ඨ කරන සිසුන් ප්‍රශංසා කරන්න.
- භාර දෙනු ලැබූ වගකීම් ඒ ආකාරයෙන්ම ඉටු කිරීම දහමේ වගකීමකි, අමානතයක් යන්න කථාවක් උදාහරණයට ගනිමින් පැහැදිලි කර දෙන්න.
- උහද් යුද්ධයේදී නබි (සල්) තුමාණන් සහාබාවාරුන්ට භාර දුන් වගකීම නිසියාකාරව ඉටු නොකර පැහැර හැරීමෙන් මුහුණ දීමට සිදුවූ පාඩුව සිද්ධියක් ලෙස සිසුන්ට පැහැදිලි කර ඒ පිළිබඳ සිසුන්ගේ ප්‍රතිචාරයන් එළිදැක්වීමට මග පාදන්න.

**ක්‍රියාකාරකම 2**

- නියමිත වේලාවට ඉටු කළ යුතු යුතුකම මොනවාදැයි සිසුන් ලවා කීමට මග සලසන්න.
- වගකීම් සියල්ල නියමිත වේලාවන් හිදීම ඉටු කිරීමෙන් අත්වන යහ ප්‍රතිඵල මොනවා දැයි ප්‍රශ්න කර, සිසුන් කරුණු ඉදිරිපත් කිරීමට මග සලසන්න.
- සලාතය, උපවාසය, යනාදී වන්දනාමානයන් නියමිත කාලයේ නියමිත වේලාවේ ඉටු කළ යුතු වගකීම් වේ. ඒවා නියමිත වෙලාවට කිරීමෙන් ඒ සඳහා වූ කුසල් සම්පූර්ණයෙන් ලබා ගත හැක යන්න සිසුන් හට පැහැදිලි කර දෙන්න.
- පාසලේදී දෙනු ලබන අභ්‍යාසයන් නියමිත වේලාවට ම කල යුතු අතර ඒවාද වගකීමක් ලෙස හඟවන්න.
- 8 යම් අභ්‍යාසයක් නැතහොත් ක්‍රියාවක් සිසුන් හට පවරා එයට දිනයක් නැතහොත් වේලාවක් සීමා කරන්න.
- නියමිත වේලාවට නැතහොත් දිනයට එම අභ්‍යාසය අවසන් කරන සිසුන් ව ප්‍රශංසා කරමින් අනෙක් සිසුන්වද උනන්දු කරවන්න.

**ක්‍රියාකාරකම 3**

- "නියත වශයෙන්ම ඔබගෙන් කෙනෙකු එක් කාර්යයක් කළහොත් එය ඉතා සාර්ථකව කරන්නාව අල්ලාහ් ප්‍රිය කරයි" යන හදීසය එක් පත්‍රිකාව ලියා ප්‍රදර්ශනය කරන්න.

- මෙම හදීසය වරක් කියවා පෙන්වන්න. එමෙන්ම පන්තියේ හොඳින් කියවිය හැකි සිසුන් දෙදෙනකු හෝ කිහිප දෙනෙකු ලවා ශබ්ද නගා කියවීමට මග පාදන්න.
- සිසුන් ඉහත කී හදීසය ඇසුරෙන් අවබෝධ කරගත්තේ කුමක් දැයි විමසන්න.
- ඉටු කළ යුතු යුතුකම් සාර්ථකව ඉටු කරන විට බොහෝ ප්‍රයෝජනයන් ලැබෙන බව සිසුන් සිතා කරුණු එළිදැක්වීමට අවස්ථාවක් ලබා දෙන්න.
- සිසුන්ගේ හොඳ වටිනා අදහස් තව තවත් ඔප් නංවමින් ඔවුන් උනන්දු කරවන්න.

තක්සේරුව:

- අදාළ වේලාවල අදාළ යුතුකම් ඉටු කරයි
- තම කටයුතු විධිමත් ආකාරයට ඉටුකරයි
- තම කටයුතු මුලුමනින්ම ඉටුකරයි

## 7.0 තේමාව : නබි (සල්) තුමා කෙරෙහි සෙනෙහසින් හා නබි (සල්) තුමාග් ආදර්ශයන් පිළිපදියි

**නිපුණතාව 7.0** : සමූහ ජීවිතයේ පිළිපැදිය යුතු යහ ගුණාංග හොඳින් අවබෝධ කර ඒ අනුව ජීවත් වෙයි

**ඉගෙනුම් පල** :
- වැඩිහිටියන්ට ගරු කරමින් ඔවුනට උදව් කරයි
- වැඩිහිටියන්ට අවනත වෙයි
- මිතුරන්ට සෙනෙහසක් දක්වමින් උදව් කරයි
- නෑදෑයින් යහපත් ආකාරයෙන් ඇසුරු කරයි
- නෑදෑයින්ට ඉටු කළ යුතු යුතුකම හරියාකාරව ඉටු කරයි

**ඉගෙනුම් සම්පත්** :
- කවි/ගීත ලියන ලද කාඩ්පත්, CD තැටි
- පාඩම් පොත ඉතිහාස සිද්ධීන්, කතා

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය**

**ක්‍රියාකාරකම 1**

- සිසුන් පන්තියේ පිටතට රැගෙන යන්න
- වැඩිහිටියන් යනු කවුරුන් දැයි කරුණු විමසන්න
- ඔවුන් ගරු කළ යුතුය. ඔවුන්ගේ ඉල්ලීම් ඉටු කළ යුතුය යනාදී කරුණු පිළිබඳ අදහස් හුවමාරු කරගන්න. නබි (සල්) තුමාණන් හා එතුමාගේ සහාබාවරුන් කටයුතු කල ආකාරය ගෙනහැර දක්වන්න. (වයසක ආච්චි කෙනෙකුගේ බඩු මළු නබි (සල්) තුමාණන් රැගෙන ගොස් උදව් කළ අවස්ථාව
- සිසුන්ගේ අත්දැකීම් විමසා බලන්න.
- පෙලපොතේ 19 වැනි 20 වැනි පාඩම උපයෝගී කරගන්න

**ක්‍රියාකාරකම 02**
- මිතුරන් යනු කවුරුන් දැයි සාකච්ඡා කර, ඔබ ඔබලාගේ මිතුරන් සමග කෙසේ හැසිරෙන්නේ දැයි ප්‍රශ්න කරමින් අදහස් හුවමාරු කරගන්න.
- පෙළපොතේ 19 වැනි, 20වැනි පාඩම පාදක කොටගෙන අදහස් හුවමාරු කරගන්න
- නෑදෑයින් පිළිබඳ අදහස් හුවමාරු කර ගනිමින්, ඔවුන් සමග කෙසේ හැසිරෙන්නේ දැයි ප්‍රශ්න කරමින් අදහස් හුවමාරු කරගන්න.
- නබි (සල්) තුමාණන්ගේ නෑදෑයින් සමග සුහදව ආශ්‍රය කලේ කෙසේ දැයි ඉතිහාස සිද්ධීන් තුළින් පෙන්වා දෙන්න. සිසුන්ගේ සිය අත්දැකිම් දැන ඔවුන්ට උනන්දු කරන්න.
- නෑදෑයින්ට ඉෂ්ට කළයුතු යුතුකම් ලැයිස්තුගත කරන්න. උදා : කරුණාව දැක්වීම්,
- අසනීප අවස්ථාවන් වල බැහැදැක්ම දුගී අවස්ථාවකදී උදව් කිරීම
- ඔවුන්ගේ දුක සැප දෙකම බෙදා ගැනිම
- අප ප්‍රිය කරන දේම ඔවුන්ටද ප්‍රිය කිරීම

තක්සේරුව:
- සමාජ ජීවිතයේ දී සියල්ලන් සමගම සහයෝගයෙන් කටයුතු කරයි
- යහපත් මිතුරන් තෝරාගනියි
- අන් අයට උදව් කරයි
- වැරදි චර්යාවලින් වැළකී කටයුතු කරයි

## 6.0 තේමාව : අක්ලාක් හා ආදාබ් එදිනෙදා ජීවිතයේ දී අනුගමනය කර හැසිරීම

**නිපුණතාව 6.1** : **සමූහ ජීවිතයේ ඉටුවිය යුතු ගුණාංග හා අගයයන් වටහාගෙන ඒ අනුව හැසිරෙයි**

**ඉගෙනුම් පල** :
- දානමානයන් කිරීම පුරුද්දක් කර ගනී
- සිනහ මුසුවෙන් හැසිරෙයි
- අනෙක් අයව ගරු කරයි
- ඔවුන් වෙනුවෙන් කැප කරයි
- ඉතා ඉවසිමෙන් කටයුතු කරයි
- සත්‍ය කතා කරයි.
- නබි (සල්) තුමාණන්ගේ කුඩා අවධිය පිළිබඳ පවසයි.

**ඉගෙනුම් සම්පත්** :
- පෙළපොත පාඩම් 20, 23, 24, 26

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

- අප හා අනෙක් අය යන මැයෙන් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- අප අනෙක් අයට හා අනෙක් අය අපට ඉටු කළ යුතු ගුණාංග, උදව් උපකාර පිළිබඳ කරුණු හුවමාරු කරන්න.
- අනෙක් අය දෙස බලා සිනහ වීම, සලාම් පැවසීම, ඔවුනට ගරු කිරීම, අපට පුළුවන් උදව් කර දීම දැනුවත්ව හෝ නොදැනුවත්ව ඔවුන් කරන වැරදි වලට සමාව දීම, සෑම අවස්ථාවකදීම සත්‍ය කතා කිරීම, අවංකව හැසිරීම යනාදී ගුණාංග පිළිපදින්නන් ලෙස මුස්ලිම්වරුන් තමා වෙනස් කළ යුතුය යන්න පිළිබඳ සාකච්ඡා කරන්න.
- නබි (සල්) තුමාණන්, ඉතිහාස නායකයින්ගේ ජීවිතය ඇසුරෙන් උදාහරණ ගෙන හැර දක්වමින් අපද එසේ හැඩගසා ගත යුතුය යන කැමැත්ත ඇති කළ යුතුය.
- පෙළ පොතෙන් හා වෙනත් පොත්පත් ඇසුරෙන් සත්‍ය කතාවන් ගෙන අදහස් හුවමාරු කර ගන්න.

තක්සේරුව:
- අන් අය සමග සුහදව හැසිරෙයි
- අන්අයට සළකමින් ඉවසීමෙන් කටයුතු කරයි

## 7.0 තේමාව: නබි (සල්) තුමාගේ ආදර්ශයෙන්

**නිපුණතාව 7.1** : නබි (සල්) තුමාණන් හට ආදරය කරමින්, එතුමාගේ ආදර්ශයන් පිළිපදියි.

**ඉගෙනුම් පල** :
- නබි (සල්) තුමාගේ විශිෂ්ඨ ගුණාංග කියා දක්වමින්, තමාද ඒවා ජීවිතයට එකතු කර ගනියි.
- නබි (සල්) තුමාණන් කළ රැකියාවන් පිළිබඳ කියයි.

**ඉගෙනුම් සම්පත්** : •

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

- සිසුන් පන්ති කාමරයෙන් පිටතට ගෙන යන්න
- පහසු ආකාරයට අසුන් ගන්වන්න
- නබි (සල්) තුමාණන් පිළිබඳ මීට පෙර තමන් උගත් දේ නැවත මතක් කර ගන්න
- නබි (සල්) තුමාණන් 'අල් අමීන්' 'අස්සාදික්' යන්න වරුදාවලියෙන් කැඳවනු ලැබුවේ ඇයි දැයි විමසන්න.
- නබි (සල්) තුමාණන් හලීමා මව්තුමිය ළඟ ජීවත්වූ කාලයේ එළිදැක්වූ යහගුණාංග පිළිබඳ සාකච්ඡා කරන්න.

- කිරි බොන අවධියේ පවා දකුණත පියයුරේ කිරි බී වම අත පියයුරෙන් කිරි බීම ප්‍රතික්ෂේප කළේ තමාගේ සහෝදරයා වෙනුවෙන්ය.

- හලිමා මව තුමියගේ පුතණුවන් නබි (සල්) තුමාගේ කිරි සහෝදරයන්) එළදෙනුන් රැකබලා ගැනීමට යන විට තමාද ඔවුන් සමග දායක විය යුතුය යනුවෙන් ඉල්ලා සිටියේය. පසු ඔහුද එළුවන් රැක බලා ගැනීමට ඔහුගේ සහෝදරයන්ට උදව් කළේය. අනෙක් අයට උදව් කිරීමට ප්‍රිය කලේය.

- කුඩා අවධියේ ම සිය මවට අහිමි කරගත් නබි (සල්) තුමාණන් තමාගේ කිරි මව වන හලිමා මව්තුමියට අදාල ගෞරවය ලබා දුන්නේ දිනෙක එතුමිය නබි (සල්) තුමාගේ සභාවට පැමිණි අවස්ථාවේ නබි (සල්) තුමාගේ උතුරු සලුව දිග හැර වාඩි කරවූහ. තෑගි බෝග ගෙනැවිත් දුන්හ.

- සිය මවගේ අභාවයෙන් පසුව තමා හදා වඩා ගත් ෆෛනබ් බින්ත් අසද් (රළි) තුමියට ගෞරව කළහ.

  උදා: එතුමිය වෆාත් වූ අවස්ථාවේ තමාගේ වස්ත්‍රය කෆන් කිරීමට ලබා දුන්නේය.
  එතුමියගේ කබ්රය තුළට බැස පව් ක්ෂමාව ඇයදුවේය.
  "එමනිසා නියත වශයෙන්ම ඔබ විශිෂ්ට යහගුණාංගවලින් පිරිපුන්ව පුද්ගලයෙක් යන්න අල්ලාහ්ට අල් කුර්ආනයේ නබි (සල්) තුමාණන් ව අගය කරන්නේය.

- මෙම ආදර්ශයන් තුළින් එකමුතුව ජීවත්වීම, පවුලේ සාමාජිකයන්ට උදව් වීම, මව්වරුන්ට ගෞරව කරන ස්තුතිවන්ත භාවයෙන් කටයුතු කිරීම යනාදී ගුණාංග ඉස්මතු වනු අපට දැකගත හැකිය යන්න ගෙනහැර දක්වන්න.

තක්සේරුව:

- නබි (සල්) බාල කාලය පිළිබඳව පවසයි
- නබි (සල්) තුමාගේ යහ ගුණයන් ගැන පවසයි
- අල් අමීන් අස්සාදික් යන විශේෂ නම් නබි (සල්) ලැබීමට හේතු කියයි
- නබි (සල්) තුමාගේ යහගුණයන් අනුගමනය කරයි

## 8.0 තේමාව: ඉස්ලාමීය ඉතිහාසය.

**නිපුණතාව 9.1:** • ඉස්ලාමීය ඉතිහාසයේ බිහිවූ විද්වතුන්ගේ ක්‍රියාවන් ප්‍රශංසා කර ඔවුන්ගේ ආදර්ශයන් පිළිපැදිය යුතුය.

**ඉගෙනුම් පල** : • ඉමාම් අබූ හනීෆා තුමාගේ අසල්වැසි සොහොයුරාව යහමග යොමු කළ සිද්ධිය කතාවක් සේ ඉදිරිපත් කරයි.

• එමගින් ලැබෙන පාඩම් ඉගෙන කියා පෙන්වයි.

**ඉගෙනුම් සම්පත්** : • විවිධ මස්ජිදවල පින්තූර (ඇතුළත, පිටත)

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1

- කතාවක් ඇසීමට සුදුසු පරිසරයක සිසුන් අසුන් ගන්වන්න
- ෆික්හ් කලාවේ විශේෂ දැනුමක් ඇති එතුමා කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කලේය.
- මහජනතාවගේ ෆික්හ් ප්‍රශ්න විසඳා තැබුවේය.
- දහවලේ දැනුම පතුරුවමින් ද රාත්‍රි කාලය නැමදුමෙහිද යෙදුනේය.
- එනමුත් එතුමාගේ කාර්‍යයන් බාධාවක් ලෙස අසල්වැසියන්ගේ නැටුම් ගැයුම්වල යෙදී තිබුණි.

- එනමුත් එතුමා ඉතා ඉවසීමෙන් ඔවුන් සමග ඇසුරු කළේය.

- ගම් වැසියන්ට ඉතා අසල්වැසියාගේ ක්‍රියා කලාපය මහ කරදරයක් බවට පත් විය. ඔවුන් එම අසල්වැසියන් පිළිබඳ පැමිණිලි කළහ.

- ගමේ ආරක්ෂක භටයන් ඔහුව සිරගත කළහ.

- මෙය ආරංචි වූ විගස ඉමාම් තුමා ආරක්ෂක භටයන්ගෙන් ඔවුන් වෙනුත් බැගෑපත් වී නිදහස කරන ලෙස ඉල්ලා සිටියේය.

- ඉමාම්ට බොහෝ සේ බාධාවක් වූවද තමා පිළිබඳ පැමිණිලි නොදමා තවද තමාව නිදහස් කිරීමට උත්සාහ කරපු ඉමාම් තුමාගේ යහගුණාංගය දැක විශ්මයට පත්විය. එමෙන්ම ඔහු සිය වරද පිළිගෙන ඉමාම් තුමාගෙන් සමාව ඉල්ලුවේය. ඒ වනතුරු තමා කරගෙන සිටි දුම්පානය, එමෙන්ම අනෙක් අයට බාධාවක් ව සිටීම යනාදී දුර්ගුණාංග වලින් වැළකී හොඳ පුද්ගලයෙකු බවට පත් විය.

තක්සේරුව:

- ඉමාම් අබූ හනීෆා (රහ්) තුමාගේ ජීවිතයේ සිදුවූ සිද්ධිය කතාවක් ලෙස කියයි
- ඉමාම් අබූ හනීෆා (රහ්) ජීවිතයේ සිදුවූ සිද්ධිය ඉගෙනුමක් ලෙස හඳුන්වයි

# ඉස්ලාම් - තක්සේරු කිරීමේ පත්‍රිකාව

| | | | | සිසුන්ගේ නම<br>ප්‍රවීණතා මට්ටමට පැමිණ ඇත √<br>ප්‍රවීණතා මට්ටමට පැමිණ නැත තව දුරටත් උදව් අවශ්‍යයි • |
|---|---|---|---|---|
| | | | | 1. සියල්ල පාලනය කරන්නා අල්ලාහ් බව දැන පවසයි |
| | | | | 2. ඊමාන් කළයුතු කරුණු හය පවසයි |
| | | | | 3. අල්ලාහ් සියල්ලටම ආහාර සපයන්නා බව කියා පෙන්වයි |
| | | | | 4. කලිමා තම්ජීදය කටපාඩමින් කියා පෙන්වයි |
| | | | | 5. කලිමතුන් තම්ජීදයේ තේරුම පවසයි |
| | | | | 6. මලාඉකාවරු දහ දෙනාගේ නම් හා ඒවායේ කාර්‍යභාරය පවසයි |
| | | | | 7. තමා හා තම අවට ඇති දේවල් පිරිසිදුව තබා ගනියි |
| | | | | 8. නිසි පරිදි පිරිසිදුවී අල් කුර්ආනය පාරායනා කරයි |
| | | | | 9. අල් කුර්ආනය මිහිරි ව ද සාවධානවද පාරායනා කරයි |
| | | | | 10. සලාතය සඳහා වුලූඃ කරයි |
| | | | | 11. උනන්දුවෙන් සලාතය ඉටුකරයි |
| | | | | 12. සූරතුල් ෆාතිහා කටපාඩම් කර නිවැදිව පාරායනය කරයි |
| | | | | 13. අත්තහියාතය කටපාඩම් කර නිවැරැදිව පාරායනය කරයි |
| | | | | 14. තම පරිසරය පිරිසිදුව තබා ගනියි |
| | | | | 15. තමා භාවිත කරන දේවල් පිළිවෙළට තබා ගනියි |
| | | | | 16. පොදු ස්ථාන පිරිසිදුව පවත්වා ගනියි |
| | | | | 17. තම යුතුකම් හා වගකීම් නිවැරැදිව ඉටු කරයි |
| | | | | 18. සමාජ ජීවිතයේදී අන් අය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි |
| | | | | 19. අන් අය සමඟ ගෞරවයෙන් හා ඉවසීමෙන් කටයුතු කරයි |
| | | | | 20. නබි (සල්) තුමාගේ ළමා කාලීන ඉතිහාසය ගැන කියයි |
| | | | | 21. ඉමාම් අබූ හනීෆා (රහ්) තුමාගේ ආදර්ශයෙන් අනුගමනය කරයි |